# ප්‍රවෘත්ති නිවේදනය

## ජාතික පාරිභෝගික මිල දර්ශකය (පදනම 2013 = 100) : 2019 මාර්තු

### ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

### ආර්ථික ප්‍රතිසංස්කරණ හා පොදු සැපයීම් අමාත්‍යාංශය

දුරකථනය: 011-2147414 ෆැක්ස්: 011-2877945 ඊමේල්: prices@statistics.gov.lk

ජාතික පාරිභෝගික මිල දර්ශකය නිකුත් කරමින් ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්, 2019 මාර්තු මාසයේ ලක්ෂ්‍යමය උද්ධමනය 2.9%ක් බව ප්‍රකාශ කළේය. පසුගිය පෙබරවාරි මාසයේ ලක්ෂ්‍යමය උද්ධමනය 2.4%ක් ලෙස වාර්තා විය. 2019 මාර්තු මාසයේ උද්ධමනය සඳහා ආහාර කාණ්ඩයේ -1.1%ක හා ආහාර නොවන කාණ්ඩයේ 3.9%ක දායකත්වයක් පිළිවෙලින් ලබා දී ඇත. එහෙත් 2018 මාර්තු මාසයේ 2.8% ක්වූ උද්ධමනයට ආහාර කාණ්ඩයේ දායකත්වය 1.2%ක් හා ආහාර නොවන කාණ්ඩයේ දායකත්වය 1.6%ක් විය.

ජාතික පාරිභෝගික මිල දර්ශකයේ මාසික වෙනස්වීම සංසන්දනය කලවිට, 2019 පෙබරවාරි මාසයේ 126.7ක් වූ දර්ශකාංකය 2019 මාර්තු මාසයේ 126.4 දක්වා පහළ යාමක් වාර්තා විය. පසුගිය මාසය හා සංසන්දනය කලවිට 2019 මාර්තු මාසයේ දර්ශකාංකය 0.3ක අඩුවීමක් එනම් 0.2ක ප්‍රතිශතකාංක අඩුවීමක් වාර්තා විය. මෙම මාසික වෙනස්වීමට ආහාර කාණ්ඩයේ වියදම්වල වටිනාකම -0.51%කින් අඩුවීම හා ආහාර නොවන කාණ්ඩයේ වියදම්වල වටිනාකම 0.25%කින් වැඩිවීම දායක වී ඇත.

ආහාර කාණ්ඩයේ වියදම්වල වටිනාකම අඩුවීම සඳහා සහල්, පොල්, එළවළු, අළුත් මාළු, පැපොල්, බිත්තර, අමු මිරිස්, රතුළූණු, ලොකුළූණු, කෙසෙල්, දෙහි සහ අර්තාපල් යන ආහාර ද්‍රව්‍යවල මිල අඩුවීම බලපා ඇත. එසේ වුවත් සුදුළූණු, බිස්කට් සහ කුකුල් මස් යන ආහාර ද්‍රව්‍යවල මිල වැඩිවීමක් වාර්තා වී ඇත.

පසුගිය මාසය හා සංසන්දනය කලවිට, 2019 මාර්තු මාසයේ ආහාර නොවන කාණ්ඩයේ වියදම්වල වටිනාකම වැඩිවීම සඳහා 'මධ්‍යසාර පාන වර්ග, දුම්කොළ හා මත්ද්‍රව්‍ය' (සිගරට්, අරක්කු සහ බුලත්), 'ප්‍රවාහන' (ඉන්ධන මිල, වාහන මිළදී ගැනීම), 'විවිධ භාණ්ඩ හා සේවා', 'රෙදිපිළි හා පාවහන්' සහ 'ගෘහ උපකරණ හා ගෘහ ඒකක නඩත්තු කටයුතු' යන කාණ්ඩවලට අයත් අයිතමයන්ගේ වියදම්වල වටිනාකම වැඩිවීම බලපා ඇත. තවද 'නිවාස, ජලය, විදුලිය, ගෑස් හා වෙනත් ඉන්ධන' කාණ්ඩයේ වියදම්වල වටිනාකම සුළු වැඩිවීමක් වාර්තා වී ඇත. එසේ වුවත් පසුගිය මාසය හා සංසන්දනය කලවිට, 'සෞඛ්‍ය', 'සන්නිවේදන', 'විනෝදාත්මක හා සංස්කෘතික', 'අධ්‍යාපන' සහ 'ආපනශාලා සහ හෝටල්' යන කාණ්ඩවල වියදම්වල වටිනාකම වෙනස් වී නොමැත.




## ජාතික පාරිභෝගික මිල දර්ශකයේ විචලනය (පදනම : 2013 = 100)

| වර්ෂය | මාසය | දර්ශකාංකය | දර්ශකාංකයේ මාසික වෙනස්වීම (%) | ලක්ෂ්‍යමය උද්ධමනය (%) |
|---|---|---|---|---|
| **2018** | මාර්තු | **122.8** | **-0.7** | **2.8** |
| | අප්‍රේල් | **122.9** | **0.1** | **1.6** |
| | මැයි | **124.3** | **1.1** | **2.1** |
| | ජූනි | **126.5** | **1.8** | **2.5** |
| | ජූලි | **126.6** | **0.1** | **3.4** |
| | අගෝස්තු | **125.4** | **-0.9** | **2.5** |
| | සැප්තැම්බර් | **124.4** | **-0.8** | **0.9** |
| | ඔක්තෝම්බර් | **124.9** | **0.4** | **0.1** |
| | නොවැම්බර් | **127.7** | **2.2** | **1.0** |
| | දෙසැම්බර් | **127.1** | **-0.5** | **0.4** |
| **2019** | ජනවාරි | **127.3** | **0.2** | **1.2** |
| | පෙබරවාරි | **126.7** | **-0.5** | **2.4** |
| | මාර්තු | **126.4** | **-0.2** | **2.9** |

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව